# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2065/36 - 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* බල/ 2/1/4/10.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* LD/05/2002/PC/243.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර :*

ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 88 ඒ කන්දෙගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද ගා. 4292 හා 2017.11.14 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0017 ක් පමණ වූ මරදානවත්ත නමැති ඉඩම් කන්දෙගොඩ දෙවට පාරේ ලද්දූ ශීලාගේ නිවස ළඟ සිට දුම්රිය පාර දක්වා අඩි 12 කට පාර පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

01. **කැබලි අංක 01 - මරදානවත්ත - හෙක්ටයාර් 0.0016**
උතුරට: එල්. ඒ. පී. කේ. ද සිල්වා හිමිකම් කියන මරදානවත්ත; නැගෙනහිරට: එල්. ඒ. පී. කේ. ද සිල්වා හිමිකම් කියන මරදානවත්ත; දකුණට: කන්දෙගොඩ දෙවට පාර; බටහිරට: කන්දෙගොඩ දෙවට පාර.

02. **කැබලි අංක 02 - මරදානවත්ත - හෙක්ටයාර් 0.0001**
උතුරට: කන්දෙගොඩ දෙවට පාර; නැගෙනහිරට: කන්දෙගොඩ දෙවට පාර; දකුණට: ඩබ්. ජනක් වසන්ත හිමිකම් කියන මරදානවත්ත; බටහිරට: ඩබ්. ජනක් වසන්ත හිමිකම් කියන මරදානවත්ත.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 ජූලි මස 11 වැනි දින පෙරවරු 10.00 ට බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018.07.04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

බී. පී. එස්. අනුරාධි,
ප්‍රාදේශීය ලේකම් ,
බලපිටිය.

2018 අප්‍රේල් මස 03 වැනි දින,
බලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 708